# දුර්ලභ දේශීය පොල් විශේෂ

පොල් ගස අතීතයේ සිටම ලංකාවේ තිබූ බව වංශකතාවලින් පෙනී යයි. පිටරටවල සිට මුහුදු දියේ පාවී එන පොල් වෙරළට ගොඩ ගසා ඉබේ පැළවෙයි. ළපටි පොල් වලට යෙදෙන "කුරුම්බා" යන වදන මාලදිවයින් වදනකි. පැරණි ග්‍රන්ථවල පොල් හඳුන්වන නාම විසිහයක් දැකිය හැකිය. රන් තැඹිලි වලට නම් අටක් ඇත. තැඹිලි ප්‍රභේද කිහිපයකි. වඩාත් දුර්ලභ රන් තැඹිලිය. නියම රන් තැඹිලි වටිනා ඖෂධයකි. එය පිටතින් කොළ පාටය. කපන විට ඇතුල රතු පාටය. කුරුම්බා වතුර ඉතා මිහිරිය. තැඹිලි තවත් ප්‍රභේද ඇත. ඒ කහපාට තැඹිලි හා තැඹිලි, කුන්දිරා යනුවෙනි. ගෙඩි ලොකු තැඹිලි විශේෂයක් ගොන් තැඹිලි ලෙස හඳුන්වයි.

ජේ.සී. කන්නන්ගර ලිවූ "ඔසුවග නාමාවලිය" ග්‍රන්ථය අනුව ඉල පොල් නමින් හඳුන්වන පොල් විශේෂයක් ලංකාවේ දැකිය හැක. පත්තිනි පූජා සඳහා කොරන පොර පොල් ගැසීමේදී අතීතයේ යොදා ගත්තේ දිගටි කටුව ඝනකම් සහිත ඉලක්කයට දමා ගැසිය හැකි "පොර පොල්" නම් පොල් විශේෂයකි. අද ඒ විරලය. තවත් දුර්ලභ පොල් ප්‍රභේද දෙකක් නම් බෝදිලි හා නවසිය. බෝදිරි-බඹර පොල් ගැඩපුලුපු යන නම් තුන බෝදිලි පොල් වලට යෙදෙයි. බෝදිලි ඉතිවල ගෙඩි කුඩාය. කුඩා ගෙඩි රැසක් එහි ඉතිවල පල ගනී. එමෙන්ම උත්සවවලදී සැරසිලි සඳහා එහි අතු භාවිතා වෙයි.

නවසි තවත් දුර්ලභ පොල් ප්‍රභේදයකි. එහි එල ඉතා රසවත්ය. නවසි ගස් පලපුරුදු අයට වෙනම හඳුනාගත හැක. වැලිගම, දෙනිපිටිය අවට දී කිරි පොල් දැකිය හැක. මේ මිල අධික මදය ඉතා රසවත් මදය සමඟ කලතා පානය කළ හැකි එකකි. ගෙඩිය මිල රුපියල් 200.00 ය ඉක්මවයි. පොල් ගසට සමාන ජලාශ්‍රිතව වැවෙන ගිං පොල් කඩොලාන විශේෂයකි. සැරසිලි සඳහා ගිං පොල් ගස හා අතු ගනී.

*එස්.කේ. ජයවර්ධන,*
*වත්තේගම හිටපු කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ,*
*"සොමිකැළුම්", නාපාන,*
*ගුන්නෑපාන.*